දෙපාර්තමේන්තු නියෝග 07/ 2017

මගේ අංක : පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.09.14

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී/
ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
අතිරේක අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

<u>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු යටතෙහි පවතින අධ්‍යක්ෂ අංශයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම.</u>

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි සංවිධාන සටහන අනුව, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ), අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යනුවෙන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු තුනක් පවතී. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි අධීක්ෂණය යටතෙහි පවතින අධ්‍යක්ෂ අංශයන්, ආයතන සහ ඒකකයන් සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයකින් තොරව රාජකාරී ලිපි ගනුදෙනු කරන අවස්ථා නිරීක්ෂණය වන බැවින්, ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා, එක් එක් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර යටතෙහි පවතින අධ්‍යක්ෂ අංශයන්/ඒකකයන් සඳහන් කරමින් මෙම දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කරනු ලැබේ.

02. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) යටතෙහි පවත්නා අධ්‍යක්ෂ අංශයන් පහත දක්වා ඇත.

I. අධ්‍යක්ෂ (වී පර්යේෂණ හා සංවර්ධන)
II. අධ්‍යක්ෂ (ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන)
III. අධ්‍යක්ෂ (උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන )
IV. අධ්‍යක්ෂ (පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන)
V. අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත් කළමනාකරණ)
VI. අධ්‍යක්ෂ (සමාජ ආර්ථික හා සැලසුම්)

03. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) යටතෙහි පවත්නා අංශයන් පහත දක්වා ඇත.

I. අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය)
II. අධ්‍යක්ෂ (බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණ)
III. අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)
IV. අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු)
V. අතිරේක අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයුම්)

04. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යටතෙහි පවත්නා අධ්‍යක්ෂ අංශයන් පහත දක්වා ඇත.

I. අධ්‍යක්ෂ (පාලන)
II. අධ්‍යක්ෂ (ආයතන)

05. ඉදිරියේදී, අදාළ වන පරිදි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ අධීක්ෂණය යටතේ රාජකාරී ඉටු කිරීමටත්, අධීක්ෂණය යටතේ පවතින අධ්‍යක්ෂ අංශ අතර මෙන්ම එක් එක් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අංශ අතර ද ලිපි ගනුදෙනු කිරීමේදී, අත්‍යවශ්‍ය අවස්ථා හඳුනාගෙන අනිවාර්යයෙන්ම අදාල අතිරේක අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් වන පරිදි පිටපත් සහිතව ලිපි සකස් කිරීමටත් උපදෙස් ලබා දෙන ලෙස අවධාරණය කරනු ලැබේ. එමගින්, අදාළ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අංශය මගින් අදාළ අධ්‍යක්ෂ අංශ පිළිබඳ මනා අධීක්ෂණයක් පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙන අතර, ඒ සඳහා අවශ්‍ය වැඩ පියවර සංවිධානය කරනු ඇත.

06. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය).
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :
01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීමට.
02. විගණකාධිපති - එම